ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

මහ කොමසාරිස්තුමා උතුරු සහ නැගෙනහිර දේශපාලන නායකයන් හමු වේ

මහ කොමසාරිස් ශ්‍රී ගෝපාල් බාග්ලේ මැතිතුමා සිය උතුරු සහ නැගෙනහිර සංචාරයේ තෙවන දිනය වූ 2021 මාර්තු 13 වන දින විවිධ දේශපාලන පක්ෂවල නායකයන් යාපනය සහ ත්‍රිකුණාමලයේදී හමු විය.

මේ අතරින් පළමු හමුව ලෙස මහ කොමසාරිස්තුමා EPDP පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කුලසිංහම් දිලීපන් මැතිතුමා හමු විය. එහිදී කුලසිංහම් දිලීපන් මැතිතුමා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉන්දියාවේ අඛණ්ඩ ස්ථාවරය වෙනුවෙන් ඉන්දියාවට සිය ස්තුතිය පළ කළේය. එසේම වන්නි ජන්ද බල ප්‍රදේශයේ ව්‍යාපෘතීන් සඳහා ඉන්දියාවේ සහයෝගය ලබා දෙන ලෙස ද එතුමා ඉල්ලා සිටියේය.

ITAK සභාපති ගරු මාවයි සේනාධිරාජා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු සෙල්වම් අඩෛයිකලනාදන් (TELO), ගරු සිද්ධාර්ථන් (PLOTE), ගරු සුමන්තිරන්, ගරු චාල්ස් නිර්මලනාදන් යන මැතිතුමන්ලා සහ උතුරු පළාතේ තරුණ නායකයන් ඇතුළු 15 දෙනෙකුගෙන් සමන්විත TNA නියෝජිත පිරිසක් පළාතේ ජනතාවගේ සංවර්ධන අවශ්‍යතාවයන් පිළිබඳව මහ කොමසාරිස්තුමා දැනුවත් කළේය. ජලය, සනීපාරක්ෂාව, අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය, සෞඛ්‍යය, කෘෂිකර්මාන්තය, සම්බන්ධීයතාවය සහ ධීවර යන ක්ෂේත්‍රයන්හි වඩා ශක්තිමත් සබඳතා සඳහා ප්‍රායෝගික යෝජනා රැසක් මෙහිදී ඉදිරිපත් විය.

TMTK නායක ගරු සී. වී. විග්නේස්වරන් මහතා, සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා (EPRLF), එන්. ශ්‍රී කාන්ත මහතා, ශිවාජිලිංගම් මහතා (දෙමළ ජාතික පක්ෂය), ආනන්දි සශිදරන් මහත්මිය (ETSK), වෙන්දන් මහතා, කදීර් මහතා (ජනනායක පොරලිකල්) සහ ඓන්කරනේසන් මහතා (පසුමායි තයාගම්) යන අයගෙන් සමන්විත දමිළ පක්ෂ නියෝජිත පිරිසක් වර්තමාන ආර්ථික සහ දේශපාලන ප්‍රමුඛතා සම්බන්ධයෙන් මහ කොමසාරිස්තුමා දැනුවත් කළේය. මෙහිදී විශේෂයෙන්ම මහ කොමසාරිස්තුමා කසල කළමනාකරණය සහ කුසලතා සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ යෝජනා අගය කළේය.

TNPF පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් සහ ගරු එස්. කජේන්ද්‍රන් යන මැතිතුමන්ලා උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා TNPF හි ප්‍රමුඛතාවයන් පිළිබඳව මහ කොමසාරිස්තුමා දැනුවත් කළේය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. ශානක්කියන් සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික් TNA සභාපති ගරු කුහදාසන් යන මහත්වරුන් ඇතුළු නැගෙනහිර පළාතේ දේශපාලන නායකයන් සමඟ මහ කොමසාරිස්තුමා ත්‍රිකුණාමලයේදී අදහස් හුවමාරු කර ගත්තේය. මෙහිදී යටිතල පහසුකම් සංවර්ධනය, කුසලතා සංවර්ධනය, ජල පහසුකම් සහ වාරිමාර්ග, කාන්තා සවිබල ගැන්වීම සහ බලශක්තිය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන්හි ආයෝජනය ඇතුළු අංශ සම්බන්ධයෙන් ප්‍රායෝගික යෝජනා රැසක් මහ කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කෙරිණ. නැගෙනහිර පළාත සංවර්ධනය කිරීම සඳහා ඉන්දියාවේ අඛණ්ඩ සහයෝගය ලබා දෙන බව මහ කොමසාරිස්තුමා සහතික විය.

මෙම සියලු සාකච්ඡාවන්හිදී දමිළ නායකයන් විසින් යටිතල පහසුකම් සංවර්ධනය, ආර්ථික ආයෝජන සහ ඉන්දීය ප්‍රදාන යටතේ අමතර සංවර්ධන සහයෝගීතා ව්‍යාපෘතීන් ඉල්ලා සිටින ලදී. මෙම ක්ෂේත්‍රයන් සඳහා ඉන්දියාවේ අඛණ්ඩ සහයෝගීතාවය ලබා දීමට තම දායකත්වය නොපිරිහෙලා ලබා දෙන බවට මහ කොමසාරිස්තුමා සහතික විය. ජනතාවගේ අවශ්‍යතාවයන් සහ ජනතාව විසින් පත් කරන ලද නියෝජිතයන් විසින් ලබා දෙන ප්‍රමුඛතාවයන්ට අනුව උතුරු සහ නැගෙනහිර පළාත් සංවර්ධනයට දිගු කලක සිට ඉන්දියාව ලබා දෙන සහයෝගය සහ කැපවීම මහ කොමසාරිස්තුමා මෙහිදී අවධාරණය කළේය.

සමානාත්මතාවය, යුක්තිය, සාමය සහ අභිමානය උදෙසා දමිළ ජනතාවගේ නීත්‍යානුකූල අභිලාෂයන්ට අදාළව ශ්‍රී ලංකා රජයේ කැපවීම් එතුමා සිහිපත් කළ අතර එක්සත් ශ්‍රී ලංකාවක් තුළ අර්ථවත් බලය බෙදීමක් හරහා ඒවා ළඟා කර ගැනීම සාමය, සංහිඳියාව, සියලු අංශ ඇතුළත් වන ප්‍රගතිය සහ රටෙහි ශක්තිය යනාදියට ද දායකත්වය ලබා දෙන බව ප්‍රකාශ කළේය.

***

කොළඹ
2021 මාර්තු 14